(125)

පරිපාලන නියෝග 01/2017

මගේ අංකය: පා/1/2/5/2
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2017.01. 10

සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම අධ්‍යක්ෂවරුන්/ ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන ගණකාධිකාරී,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
අතිරේක අධ්‍යක්ෂවරුන්
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සහකාර අධ්‍යක්ෂවරුන්,
ස්ථාන භාර නිලධාරීන්,
පරිපාලන නිලධාරීන්,
ඒකක / ශාඛා ප්‍රධානීන්,

**රාජකාරි පැවරීම - ශ්‍රී ලංකා පරිපාලන සේවය**

රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශ ලේකම් ගේ අංක CS/SLAS/ANN.TRA-2017 හා 2016.09.22 දිනැති ලිපිය පරිදි මෙම දෙපාර්තමේන්තුවෙහි සේවයට වාර්තා කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරී, කේ.ජී.එස්.පී. කළුආරච්චි මහතා, දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ (ආයතන) තනතුරෙහි රාජකාරි භාර ගැනීම මත පහත පරිදි පරිපාලන අංශයේ රාජකාරි පවරා ඇති බව දැනුවත් කිරීම පිණිස මෙම පරිපාලන නියෝගය නිකුත් කරනු ලැබේ.

**අධ්‍යක්ෂ (ආයතන) - කේ.ජී.එස්.පී. කළුආරච්චි මහතා (ශ්‍රී ලං.ප.සේ. I ශ්‍රේණිය)**

1. දෙපාර්තමේන්තුවෙහි ආයතන අංශයේ සියළු කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම.
2. ආයතන අංශයේ රාජකාරි පිළිබඳ ප්‍රතිපත්තිමය උපදෙස් සහ මාර්ගෝපදේශයන්ට අදාළව නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
3. පහත සඳහන් ආයතන ශාඛාවන්හි අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය සහ මෙහෙයුම් රාජකාරි.

| | | | |
|---|---|---|---|
| I. | ආයතන 01 | - | විධායක හා මාණ්ඩලික ශ්‍රේණි තනතුරු ශාඛාව |
| II. | ආයතන 02 | - | තාක්ෂණ සේවය හා තාක්ෂණ සහායක තනතුරු ශාඛාව |
| III. | ආයතන 03 | - | ආශ්‍රිත සේවා හා කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන තනතුරු ශාඛාව |
| IV. | ආයතන 04 | - | ප්‍රාථමික ශිල්පීය / අර්ධ ශිල්පීය තනතුරු ශාඛාව |
| V. | ආයතන 05 | - | ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු ශාඛාව |
| VI. | ආයතන 06 | - | විශ්‍රාම වැටුප් ශාඛාව |
| VII. | ආයතන 07 | - | ශිෂ්‍යත්ව ශාඛාව |
| VIII. | ආයතන 08 | - | ඇප ශාඛාව |
| IX. | ආයතන 09 | - | ණය ශාඛාව |
| X. | ආයතන 10 | - | අග්‍රහාර ශාඛාව |

4. දෙපාර්තමේන්තුවෙහි සියළුම අධ්‍යක්ෂ අංශ අතර ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.
5. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කාර්ය සාධන ක්‍රියාවලිය විධිමත්ව පවත්වා ගැනීම සහ අදාල පරිදි වැටුප් වර්ධක තීරණ ලබා දීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
6. ආයතන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (ආයතන) හා ආයතන අංශයට අනුයුක්ත පරිපාලන නිලධාරීන්, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය හා අනෙකුත් සේවාවන්ට අදාළ නිලධාරීන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය.
7. අධ්‍යක්ෂ (පාලන) නොමැති අවස්ථාවල දී අදාළ රාජකාරි ඉටු කිරීම.
8. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) විසින් පවරනු ලබන වෙනත් රාජකාරි.

එච්.පී. දයාමැණිකේ සරත්චන්ද්‍ර.
ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය.
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත: ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම පිණිස.